### 08.මේ බෙහෙත් ගත්තම මට ප්‍රශ්නයක් වෙයිද ?

මේ බෙහෙත් වර්ග ගොඩක් සුරක්ෂිතයි. ඒවා පාවිච්චි කරනවිට මුත්‍රා රත් පැහැ වීමක් වෙන්න පුළුවන්. එයට හේතුව මාසයකට වරක්, මාසයේ පළමු දවසේ ලබා ගන්න බෙහෙත් වල තිබෙන වර්ණකයක්. එයට කිසිසේත්ම බිය විය යුතු නැහැ.

### 09.මෙයට අමතරව තවත් අතුරු ආබාධ ඇති වෙනවද ?

ඉතාම කලාතුරකින් ඇස් කහවීම, මුත්‍රා කහවීම, තදබල කෑම අරුචිය, අධික තෙහෙට්ටුව, සමේ තදබල කැසීම් ඇති වෙන්න පුළුවන්.

එහෙම වුනොත් හැකි ඉක්මනින් ළඟම තිබෙන රජයේ රෝහලේ සමේ රෝග සායනයට යන්න.

### 10.මේ බෙහෙත් බිව්වම කළු වෙනව කියන්නෙ ඇත්තද ?

සමහර අයට එහෙම වෙන්න පුළුවන්. නමුත් ප්‍රතිකාර සම්පූර්ණ කළ පසු එය නැති වී යනවා.

### 11.ගෙදරදි මම අනිත් අයගෙන් වෙන් වෙලා ඉන්න ඕනෙද ?

ගෙදරදි වෙන් වෙලා, හැංගිලා ඉන්න ඕනෙ නැහැ. සාමාන්‍ය විදිහට ජීවත් වෙන්න පුළුවන්.

### 12.මට මේ රෝගය ගැන වැඩිදුර තොරතුරු දැනගන්න පුළුවන් කොතනින්ද ?

ළඟම තියෙන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයෙන් හෝ රජයේ රෝහලේ සමේ රෝග සායනයෙන් සියලු තොරතුරු දැනගන්න පුළුවන්.

**නිසි ප්‍රතිකාර ගෙන**
**ලාදුරු රෝගය**
**ශ්‍රී ලංකාවෙන් තුරන් කිරීමේ**
**මහඟු කර්තව්‍යයට**
**දැන් ඔබටත්**
**දායක වෙන්න පුළුවන්**

ශ්‍රී ලංකා ජාතික රෝහලේ
මධ්‍යම ලාදුරු සායනය
දුරකතන අංකය : 011-2696444

FAIR MED
Health for the poorest



**නිසි කල නිසි පෙති ගෙන**

**දුරලමු**

**වළකමු**

**උවදුරු**

# ලාදුරු

## 01.ලාදුරු රෝගය කියන්නේ මොකක්ද ?

බැක්ටීරියාවක් මගින් බෝවන, නිසි ප්‍රතිකාර ගැනීමෙන් සම්පූර්ණයෙන්ම සුව කල හැකි රෝගයක්.

## 02.මෙම රෝගයට බෙහෙත් තියෙනවද?

ඔව්.

## 03.මගෙන් අනිත් අයට රෝගය බෝවීම බෙහෙත් පාවිච්චියෙන් නවතිනවද ?

බෙහෙත් ගත්ත මුල් දවස් දෙක තුල රෝගය තවත් අයෙකුට බෝවීමට ඇති හැකියාව නතර වෙනවා.

## 04.මේ බෙහෙත් කොපමණ කාලයක් පාවිච්චි කරන්න ඕනෙද ?

සමේ රෝග සායනයේ දී හඳුනාගෙන, ඒ අනුව ප්‍රතිකාර කාලය මාස 6-9 ක් හෝ 12 ක් වෙන්න පුළුවන්.

- බෝනොවන ලාදුරු (Paucibacillary) වර්ගයට මාස 06 ක්

PB-A



PB-C



- බෝවන ලාදුරු (Multibacillary) වර්ගයට මාස 12 ක්

MB-A



MB-C



## 05.මේ බෙහෙත් ෆාමසියෙන් හෝ පුද්ගලික සායනයකින් ලබා ගන්න පුළුවන්ද ?

රජයේ රෝහලේ සමේ රෝග සායනයෙන් මේ බෙහෙත් නොමිලේ ලබා ගන්න පුළුවන්.

## 06.මේ බෙහෙත් හැමදාම පාවිච්චි කරන්න ඕනෙද ?

ප්‍රතිකාර කාලය සම්පූර්ණ වන තුරු අතපසු නොකර දිනපතා බෙහෙත් බොන්න ඕනෙ.

## 07.බෙහෙත් හරියට පාවිච්චි නොකළොත් මට මොනව වෙයිද ?

I.ඔබගේ රෝගය වැඩිවෙලා, අත් පා ආබාධිත වෙලා, මුහුණේ ද විකෘති වීමක් වෙන්න පුළුවන්.

II.ප්‍රතිකාර සම්පූර්ණ නොකළොත්, මේ රෝගය ඇති කරන බැක්ටීරියාව විනාශ කරන්න මෙම බෙහෙත්වලට ඇති හැකියාව නැතිව යනවා. ඒක බොහොම භයානක තත්වයක්.

III.ඔබව නැවත සමේ රෝග සායනයට යොමු කිරීමට සෞඛ්‍ය කාර්යය මණ්ඩලයට සිදු වෙනවා.